(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ-

# වාණිජ ධාරා

ACCOUNTING - 33

## වාණිජ විෂයය ගුරු සිසු අත්වැල


අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ

සම්පත් දායකත්වය කේ.එච්.එන්.කේ.සමරක්කොඩි

ර/උඩගම මහා විද්‍යාලය පින්නවල බලංගොඩ


පරිගණක ගත කිරීම පරිගණක මධ්‍යස්ථානය - කුරුවිට

## නිපුණතාව 12

## සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන

නිපුනතාවය 12

# සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

## නිපුණතා මට්ටම 12.1

සීමාසහිත සමාගමක් ආශ්‍රිතව ඇති නෛතික පසුබිම විමසා බලයි.


## ඉගෙනුම් පල

- සීමාසහිත සමාගම් යන්න නිර්වචනය කරන්න.
- 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව සමාගම් වර්ග කරයි.
- සමාගම් ගිණුම්කරණය සඳහා නෛතික පසුබිමක් පවතින බව පැහැදිලි කරයි.
- සමාගමක් විසින් පවත්වා ගත යුතු වාර්තා නම් කරයි.
- සමාගමකට නිකුත් කළ හැකි කොටස් වර්ග හා ප්‍රකාශිත ප්‍රාග්ධනය පැහැදිලි කරයි.

# සමාගමක් යනු

- 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව ලියාපදිංචි කළ යුතු නීතිමය පුද්ගල භාවයක් සහිත ව්‍යාපාර සංවිධාන වර්ගයකි.

# 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව සමාගම් වර්ගීකරණය



# ක්‍රියාකාරකම 01

**පහත සඳහන් ව්‍යාපාර සංවිධානවල වෙනස්කම් 03 ක් සඳහන් කරන්න.**

| සීමාසහිත පොදු සමාගම් | සීමාසහිත පෞද්ගලික සමාගම් |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |
| 3. | 3. |

# සමාගමක ගිණුම්කරණය සඳහා නෛතික පසුබිම

- සීමිත සමාගම් ගිණුම් පිළියෙල කිරීමේ දී පහත සඳහන් නීතිරීති හා අණපනත් අනුගමනය කළ යුතුය.
- 1995 අංක 15 දරන ගිණුම්කරණ හා විගණන පනත
- 2007 අංක 07 දරන සමාගම් පනත
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත
- කොටස් වෙළෙඳපොළ නීතිරීති

# සමාගමක් විසින් පවත්වා ගත යුතු වාර්තා

- සමාගමක් තම මුදල් ලැබීම් හා ඒ මුදල් වියදම් කළ ආකාරය දැක්වෙන වාර්තා
- සමාගමේ වත්කම් හා බැරකම් පිළිබඳ වාර්තා
- භාණ්ඩ වෙළෙඳම හා සම්බන්ධව නම් ණයට ගැනුම් හා විකුණුම් පිළිබඳ ගනුදෙනුකරුවන්ගේ  හා සැපයුම්කරුවන්ගේ වාර්තා
- අවසාන තොග වාර්ාතා
- සේවා සැපයීම සම්බන්ධ නම් සේවා වාර්තා

# සීමිත සමාගමක කොටස් වර්ග

සමාගම් පනතේ 49 වගන්තියට අනුව කොටසක් යනු චංචල දේපලකි.සීමිත සමාගමකට නිකුත් කළ හැකි කොටස් වර්ග කිහිපයකි.

01. සාමාන්‍ය කොටස්

02. වරණීය කොටස්

03. විශේෂිත කොටස්

# ක්‍රියාකාරකම 02

- දක්වා ඇති නිර්ණායක මත පහත කොටස් වර්ග දෙකෙහි අසමානකම් වගුවේ දක්වන්න.

| නිර්ණායක | සාමාන්‍ය කොටස් | වරණීය කොටස් |
|---|---|---|
| 01.සමාගමේ හිමිකාරිත්වය | | |
| 02.ලාභාංශ අයිතිය | | |
| 03. ඡන්ද අයිතිය/බලය | | |
| 04. පරිපාලන බලය | | |

## ක්‍රියාකාරකම 03

- සීමා සහිත නිලුකා සමාගම සංස්ථාපනය කළ වහාම සාමාන්‍ය කොටස් 50000 ක් කොටසක් රු.18 බැගින් නිකුත් කර මුදල් ලබා ගන්නා ලදී.සමාගමේ ප්‍රකාශ කළ ප්‍රාග්ධනය කොපමණ ද?

## ක්‍රියාකාරකම 04

- සීමා සහිත ජානක සමාගම සාමාන්‍ය කොටස් 80000 ක් පහත සඳහන් පරිදි මුදල් ලබා ගැනීම සඳහා නිකුත් කරඇත.

අයඳුමේදී කොටසකට රු.12

ඇරයුමේ දී කොටසකට රු .8

ඇරයුම කැඳවා ඇත.සමාගමේ ප්‍රකාශ කළ ප්‍රාග්ධනය ගණනය කරන්න.

# ප්‍රකාශිත ප්‍රාග්ධනය


- සමාගමක් අරමුදල් රැස් කර ගැනීමට සමාගමේ කොටස් මහජනතාවට නිකුත් කරයි.එලෙස කොටස් නිකුත් කර ලබා ගන්නා ප්‍රාග්ධනය **ප්‍රකාශිත ප්‍රාග්ධනය** වේ.

- සමාගම් පනතේ 58 වගන්තියට අනුව " කොටස් නිකුත් කිරීම සම්බන්ධයෙන් සහ කොටස් මත වූ ඇරයුම සම්බන්ධයෙන් සමාගමට ලැබුණු හා ලැබිය යුතු සියලු මුදල්වල එකතුව" **ප්‍රකාශිත ප්‍රාග්ධනය** වේ.

## කොටසක ප්‍රතිෂ්ඨාව

කොටසක ප්‍රතිෂ්ඨාව යනු කොටසක නිකුතු අගයයි.සමාගම් පනතේ 52 වගන්තියට අනුව සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලය කොටසක ප්‍රතිෂ්ඨාව තීරණය කරයි.






කොටසක ප්‍රතිෂ්ඨාව ලබා ගත හැකි ආකාරය







වෙනත් සුරැකුම්පත්

## නිපුණතාව 12

# සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි

### නිපුණතා මට්ටම 12.2

කොටස් නිකුතුවේ දී ප්‍රතිෂ්ඨාව එකවර ලබාගන්නා විට

එම ගනුදෙනු ගිණුම්ගත කරයි.

## ඉගෙනුම් පල

- ❖ කොටසක ප්‍රතිෂ්ඨාව පැහැදිලි කරයි.
- ❖ කොටසක ප්‍රතිෂ්ඨාව ලබාගන්නා ක්‍රම නම් කරයි.
- ❖ කොටස් ප්‍රතිෂ්ඨාව මුදලින් එකවර ලබාගන්නා විට ගිණුම් පිළියෙල කරයි.

## ක්‍රියාකාරකම 01

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. කොටසක් යනු කුමක් ද?

02. කොටසක ප්‍රතිෂ්ඨාව යනු කුමක් ද?

03. සීමා සහිත පොදු සමාගමකට ප්‍රාග්ධනය සපයා ගන්නේ කෙසේ ද?

04. කොටසක ප්‍රතිෂ්ඨාව තීරණය කිරීම හා ඒ සඳහා අනුමැතිය ලබා ගත යුත්තේ කෙසේ ද?

05. කොටසක ප්‍රතිෂ්ඨාව පියවිය හැකි ආකාර මොනවා ද?

# සමාගමක කොටස් නිකුත් කිරීම සිදු කළ හැකි අවස්ථා

- ❖ මූලික ප්‍රසිද්ධ නිකුතුවක් මඟින්

- ❖ පරිණත ප්‍රසිද්ධ කොටස් නිකුතුවක් මඟින්

# කොටසක ප්‍රතිෂ්ඨාව එකවර ලබා ගැනීමට අදාළ ජ'නල් සටහන්

❖ අයදුම්පත් සමඟ මුදල් ලබා ගැනීම.

මුදල් පාලන ගිණුම (හර)

කොටස් නිකුත් කිරීමේ ගිණුම (බැර)

❖ කොටස් විභජනය කිරීම.

කොටස් නිකුත් කිරීමේ ගිණුම (හර)

ප්‍රකාශිත ප්‍රාග්ධන ගිණුම (බැර)

# සමානුපාතික විභජනය

කිසියම් අනුපාතයකට හෝ අනුපාත කිහිපයක් පදනම් කර ගනිමින් කොටස් විභජනය කිරීම **සමානුපාතික විභජනය** නමින් හඳුන්වයි.

- සමාගම නිකුත් කරන ලද කොටස් ප්‍රමාණයකට වඩා වැඩියෙන් අයදුම්පත් ලද විටෙක වැඩිපුර ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කර මුදල් ආපසු යැවීම.

කොටස් නිකුත් කිරීමේ ගිණුම (හර)

මුදල් පාලන ගිණුම (බැර)

## නිපුණතාව 12

# සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරයි

## නිපුණතා මට්ටම 12.3

සංචිත ප්‍රාග්ධනිත කිරීම හා හිමිකම් නිකුතුව සම්බන්ධ ගනුදෙනු ගිණුම් ගත කරයි.

## ඉගෙනුම් පල

- හිමිකම් කොටස් නිකුතුව පැහැදිලි කරයි.
- සංචිත ප්‍රාග්ධනිත කිරීම පැහැදිලි කරයි.
- හිමිකම් කොටස් නිකුතුව හා සංචිත ප්‍රාග්ධනිත කිරීම අතර සමාන අසමානකම් දක්වයි.
- හිමිකම් කොටස් නිකුතුව හා සංචිත ප්‍රාග්ධනිත කිරීම ගිණුම්ගත කරයි.

# හිමිකම් කොටස් නිකුතුව

සීමිත සමාගමක දැනට සිටින සාමාන්‍ය කොටස් හිමියන්ට මුදල් අය කර ගෙන කිසියම් අනුපාතයකට කොටස් නිකුත් කිරීම.

❖ හිමිකම් කොටස් නිකුතුවට අදාළ ජ'නල් සටහන

මුදල් ගිණුම හර

සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධන ගිණුම බැර

(....................අනුපාතයකට හිමිකම් කොටස් නිකුත් කිරීම )

# සංචිත ප්‍රාග්ධනිත කිරීම

සීමිත සමාගමක දැනට සිටින සාමාන්‍ය කොටස් හිමියන්ට මුදල් අය කර නොගෙන සංචිත භාවිත කර කිසියම් අනුපාතයකට කොටස් නිකුත් කිරීම.

- සංචිත ප්‍රාග්ධනිත කිරීමට අදාළ ජ'නල් සටහන

අදාළ සංචිත ගිණුම හර

සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධන ගිණුම බැර

(....................අනුපාතයකට සංචිත ප්‍රාග්ධනිත කිරීමට කිරීම )

## නිපුණතාව 12

# සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි

## නිපුණතා මට්ටම 12.4.1

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

# ඉගෙනුම් පල

- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමිතයේ නිර්දේශ අනුව ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කරයි.
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරයි.
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය පිළියෙල කරයි.
- මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඉදිරිපත් කරයි.

# සීමා සහිත පොදු සමාගමක අවශ්‍යතා දෙකක් පදනම් කරගෙන පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශන

- විශේෂ පරමාර්ථ සඳහා
- පොදු පරමාර්ථ සඳහා

- විශේෂ පරමාර්ථ සඳහා මූල්‍ය ප්‍රකාශන

මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකාරිත්ව අවශ්‍යතා සඳහා සියලු තොරතුරු ඇතුළත් කරමින් පිළියෙල කරන අතර ඒවා විස්තරාත්මක මූල්‍ය ප්‍රකාශන නමින් හඳුන්වයි.

- පොදු පරමාර්ථ සඳහා මූල්‍ය ප්‍රකාශන

මෙම මූල්‍ය ප්‍රකාශන බාහිර පාර්ශවයන්ගේ අවශ්‍යතා මත පොදුවේ ගිණුම්කරණ තොරතුරු සැපයීම සඳහා පිළියෙල කරයි.

## පොදු පරමාර්ථ සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අදාළ කර ගත යුතු නිර්දේශ හා විධිවිධාන

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි නිර්දේශ හා ආකෘති හා මඟපෙන්වීම්
- මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවේ නිර්දේශ
- 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන
- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත කමිටු මඟපෙන්වීම්

# පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවල සංරචක

- ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්

නිපුණතාව 12

# සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි

නිපුණතා මට්ටම 12.4.2

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව සීමාසහිත සමාගමක මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරයි.

# ඉගෙනුම් පල

- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ගිණුම් ප්‍රමිතයට අනුව පැහැදිලි කරයි.
- මෙහෙයුම් ක්‍රියාකාරකම් පැහැදිලි කරයි.
- ආයෝජන ක්‍රියාකාරකම් පැහැදිලි කරයි.
- මූල්‍ය ක්‍රියාකාරකම් පැහැදිලි කරයි.
- ගිණුම්කරණ ප්‍රමිතයට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරයි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශන ප්‍රයෝජනයට ගන්නා පාර්ශවයන්ගේ ආර්ථික තීරණ ගැනීම සඳහා ව්‍යාපාරයක කිසියම් කාලච්ඡේදයක් සඳහා මුදල් හා මුදල් හා සමාන දෑවල සිදු වූ වෙනස්වීම් මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් වශයෙන් වර්ග කර මුදල් ජනනය හා භාවිතය නිරූපණය කෙරෙන ප්‍රකාශනයයි.

# ප්‍රමිතයේ සඳහන් නිර්වචන

01. මුදල් :- අතැති මුදල් හා ඉල්ලුම් තැන්පතු

උදා : මුදල් ශේෂය,සුළු මුදල් ශේෂය

02.මුදල් හා සමාන දෑ :- කිසිදු අවදානමකින් තොර ව මුදල් බවට පරිවර්තනය කළ හැකි ඉතා ඉහළ ද්‍රවශීලතාවෙන් යුත් කෙටිකාලීන ආයෝජන වේ.

උදා : භාණ්ඩාගාර බිල්පත් (මාස 03)

03. මුදල් ප්‍රවාහයන් :- මුදල් හා මුදල් හා සමාන දෑ ආයතනය තුළට ගලා ඒම ලැබීම් ප්‍රවාහයක් ලෙස ද ගලා යෑම් ගෙවීම් ප්‍රවාහයක් ලෙස ද හැඳින්වේ.

**04. මෙහෙයුම් ක්‍රියාකාරකම් :-** ව්‍යාපාර ආයතනයක ප්‍රධාන ආදායම් ඉපදවීමේ ක්‍රියාමාර්ග තුළින් ඇතිවන මුදල් ප්‍රවාහයන් **මෙහෙයුම් ක්‍රියාකාරකම්** වේ.

උදා :

- අත්පිට විකුණුම්
- වෙළෙඳ ලැබිය යුතු දෑ මත ලද මුදල්
- අත්පිට ගැනුම්
- වෙළෙඳ ගෙවිය යුතු දෑ සඳහා ගෙවූ මුදල්
- මුදලින් ගෙවූ පරිපාලන,බෙදාහැරීමේ හා අනෙකුත් මෙහෙයුම් වියදම්
- ගෙවූ පොලී
- ගෙවූ ආදායම් බදු

**05. ආයෝජන ක්‍රියාකාරකම් :- අනාගත ආදායම් උත්පාදනය කිරීමේ අපේක්ෂාවෙන් වර්තමානයේ දී සම්පත් වෙනුවෙන් කෙරෙන මුදල් ප්‍රවාහයන් ආයෝජන ක්‍රියාකාරකම් වේ.**

**උදා :**

- **දේපල පිරියත හා උපකරණ මිලට ගැනීම වෙනුවෙන් කරන ගෙවීම්**
- **දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල්**
- **වෙනත් ව්‍යාපාරවල ස්කන්ධය හා ණය ප්‍රාග්ධනය අත්පත් කර ගැනීම වෙනුවෙන් කරන ගෙවීම්**
- **වෙනත් ව්‍යාපාරවල ස්කන්ධය හා ණය ප්‍රාග්ධනය විකිණීමෙන් ලද මුදල්**
- **ලැබූ පොලී**
- **ලැබූ ලාභාංශ**
- **ලැබූ කුලී**
- **සේවක ණය දීම්**

**06. මූල්‍ය ක්‍රියාකාරකම්** :- ව්‍යාපාරයක ස්කන්ධයේ හා ණය ප්‍රාග්ධනයේ ප්‍රමාණයේ හෝ සංයුතියේ වෙනස්කම් ඇති කෙරෙන මුදල් ප්‍රවාහයන් **මූල්‍ය ක්‍රියාකාරකම්** වේ.

උදා :

- ❖ කොටස් නිකුත් කිරීමෙන් ලද මුදල්
- ❖ කොටස් නිදහස් කිරීමට ගෙවන මුදල්
- ❖ ණයකර හෝ වෙනත් දිගුකාලීන ණයගැනීම්වලින් ලද මුදල්
- ❖ ණයකර හෝ වෙනත් දිගුකාලීන ණය ආපසු ගෙවීම්
- ❖ ලාභාංශ ගෙවීම
- ❖ මූල්‍ය කල්බදු වාරික ගෙවීම් ( පොලී හැර)
- ❖ අයිතිකරුවන් වෙත කරන බෙදාහැරීම්

## මුදල් ප්‍රවාහ වාර්තා කිරීම

වයාපාරයක ගිණුම් කාලච්ඡේදයකට අදාළ මුදල ප්‍රවාහයන් වාර්තා කිරීමේ ක්‍රම

01. ඍජු ක්‍රමය

02. වක්‍ර ක්‍රමය

මෙම ක්‍රම දෙකට ම ගණනය කළ හැකි වන්නේ ව්‍යාපාරයක මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහ පමණි. ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් ගණනය කළ හැකි වන්නේ ඍජු ක්‍රමයට පමණි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් සකස් කර ඇත්තේ ඍජු ක්‍රමයට ද වක්‍ර ක්‍රමයට ද යන්න තීරණය වන්නේ මෙහෙයුම් ක්‍රියාකාරකම් ගණනය කිරීමේ දී අනුගමනය කරන ලද ක්‍රමය පදනම් කර ගැනීමෙනි.

## 01 ඍජු ක්‍රමය

ඍජු ක්‍රමයේ දී ආයතනයක දළ මුදල් ලැබීම් හා දළ මුදල් ගෙවීම් සියල්ල අනාවරණය කරයි.මෙහෙයුම් ක්‍රියාකාරකම් ඍජු ක්‍රමයට වාර්තා කිරීමේ දී ශුද්ධ ලාභය ගණනය කිරීමට යොදා ගන්නා ආදායම් හා වියදම් අයිතමයන්ගේ ජනනය වූ මුදල් ප්‍රවාහයන් අදාළ කර ගනියි.

## 02. වක්‍ර ක්‍රමය

වක්‍ර ක්‍රමයේ දී මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් ගණනය කිරීමේ දී වර්ෂයේ ශුද්ධ ලාභයට හෝ ශුද්ධ ආදායමට මුදල් නොවන ගනුදෙනු කාරක ප්‍රාග්ධන අයිතමයන්ගේ වෙනස්වීම් සහ වෙනත් ක්‍රියාකාරකම්වලට අයත් එහෙත් ලාභය තුළ අඩංගු අයිතම වෙනුවෙන් ගැළපීම් කරනු ලබයි.මෙම ක්‍රමයට මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් ගණනය කිරීමේ දී කාලච්ඡේදයේ බදු පෙර ශුද්ධ ලාභය ගෙන එහි අඩංගු මුදල්මය නොවන අයිතම ඉවත් කර ,කාරක ප්‍රාග්ධනයේ සංචලනයන් ගළපනු ලබයි.ඊට පසු මුදලින් ගෙවූ ආදායම් බදු හා ණය පොලී අඩු කර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් ගණනය කරනු ලබයි.